**ජල සම්පත් මණ්ඩලය - 2021**

**------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**---------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

**----------------------------**

ජල සම්පත් මණ්ඩලයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය , හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**-------------------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

**-----------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳ අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදි.

රට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගැයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේද යන බව,

- යම් අදාල ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව මණ්ඩලයේ ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාල නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ජල සම්පත් මණ්ඩලය 1978 වර්ෂයේ සිට පවත්වාගෙන ගොස් තිබූ හෙක්ටර් කොබ්බෑකඩුව මාවතේ ප්‍රධාන කාර්යාලය පිහිටි ඉඩම සඳහා 2013 වර්ෂයේ සිට වාර්ෂිකව රු.12,772,000 ක බදු මුදලක් ගෙවා වාර්ෂික බදු බලපත්‍රයක් ලබා ගන්නා ලෙස තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම්ගේ අංක නිප්‍රාලේ/1/10/2/160 හා 2016 ජූලි 05 දිනැති ලිපිය මගින් දැනුම් දී තිබුණි. ඊට අනුකූලව කටයුතු නොකිරීම හේතුවෙන් තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් විසින් 2019 වර්ෂයේදී කොළඹ මහේස්ත්‍රාත් අධිකරණයේ නඩුවක් ගොනුකොට තිබුණි. එම නඩුවේ වර්තමාන තත්වය පිළිබඳ කිසිදු තොරතුරක් මණ්ඩලය සතුව නොතිබුණි. ඒ පිළිබඳ පැහැදිලි කරගැනීමක් තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් වෙතින් විධිමත් ලෙස සිදුකර නොතිබුණි. ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 08 ප්‍රකාරව එමගින් පැනනැගිය හැකි අසම්භාව්‍ය බැරකම සඳහා මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | මණ්ඩලය ප්‍රධාන කාර්යාලය පවත්වාගෙන ගිය කොළඹ 07 හෙක්ටර් කොබ්බෑකඩුව මාවතේ පිහිටි ඉඩම රජයේ ඉඩමක් වන අතර දිගුකාලීන බදු පදනමක් මත එය මණ්ඩලයට ලබාදෙන ලෙසට ඉල්ලුම් කරන ලද නමුත් වාර්ෂිකව මිලියන 12.772 ක බද්ධක් යටතේ කෙටිකාලීන පදනම මත ලබා ගන්නා ලෙස දැනුම් දී තිබුණත් ඒ සඳහා ඒකඟ වී බදු ගිවිසුමකට ඇතුලත් වී නොමැත. දිගු කාලීන බදු පදනමක් මත ලබාදෙන ලෙසට කරන ලද ඉල්ලීම නොසලකා ඉඩමෙන් අස්කිරීමේ නියෝගයක් නිකුත්කර කොළඹ මහාධිකරණයේ නඩු පවරා තිබුණි. නමුත් 2020.10.12 දින පැවති නඩු දිනයේදී දෙපාර්ශවයම රජයේ ආයතන බැවින් නඩු කටයුතු පවත්වාගෙන යැමෙන් තොරව සමථයකට පත්කර ගන්නා ලෙසට නීතිපති දන්වා ඇති බව තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් දනවන ලදී. නඩු පැවරීම සම්බන්ධව මේ වන විට විශ්වසනීය ලෙස තහවුරු වී නොමැති අතර, අසම්භාව්‍ය බැරකම් ලෙස හෙළිදරව් කිරීමේ අවශ්‍යතාවයක් නොමැති තත්වයක් මෙවන විට පවති. ප්‍රධාන කාර්යාලයද 2021.07.18 දින සිට එම ස්ථානයෙන් ඉවත් කර ගෙන ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 08 අනුව කටයුතු කළ යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට වූ ණයගැති ශේෂයෙහි වර්ෂයකට වඩා පැරණි රු.700,763 ක් වූ අකර එකී වටිනාකම තුළ අන්තර්ගත රු. 287,763 ක් මහවැලි එල් කලාපයේ අත්පොම්ප නළ ලිං අලුත්වැඩියා කිරීම වෙනුවෙන් ලැබිය යුතු හිග ශේෂයක් විය එකී වටිනාකම 2018 වර්ෂයේ සිට පැවතගෙන එන අතර එය මහවැලි අධිකාරිය වෙතින් අයකර ගැනීමට මණ්ඩලය කටයුතු කර නොතිබුණි. | මෙම 287,763 ක මුදල මහවැලි අධිකාරිය මගින් ලබා ගැනීමට බොහෝ වාරයක් වාචිකව හා ලිඛිතව උත්සහ කලද එම කටයුතු සිදු කර ගැනීමට නොහැකි විය. මේ සම්බන්ධව ජල සම්පත් මණ්ඩලයේ සභාපතිතුමා දැනුවත් කල අතර ඉදිරියේදී මහවැලි අමාත්‍යාංශයේ ලේකම්තුමා සමග සම්බන්ධ වී මේ සම්බන්ධව සාකච්ඡා කර, හැකි ඉක්මනින් මෙම ගැටලුව නිරාකරණය කර ගැනීමට කටයුතු සිදු කරනු ලබයි. | ණය ශේෂ අයකර ගැනීම යාවත්කාලීනව සිදු කළ යුතුය. |

### 1.6.2 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සේවා අත්තිකාරම් ගිණුමේ පැවති ශේෂයෙන්, රු.5,382,771 ක් වර්ෂයකට වඩා පැරණි අත්තිකාරම් ශේෂයක් විය. ඉන් රු.3,553,471 ක් මණ්ඩලය විසින් ඊට අදාළ කාර්යයන් ඉටු නොකිරීම හේතුවෙන් නැවත ගෙවීමට සිදු වී තිබුණි. තවද නළ ලිං ඉදි කිරීම අසාර්ථක වීම හේතුවෙන් රු.1,597,000 ක මුදල් නැවත ගෙවීමට මණ්ඩලයට සිදු වී තිබුණි. මණ්ඩලය විසින් කාර්යයන් ඉටුකිරීමේ ප්‍රමාදය හා සිදුකරනු ලබන කාර්යයන්ගේ සඵලදායිතාව නොමැති වීම හේතුවෙන් රු.5,150,471 ක ආදායමක් මණ්ඩලයට අහිමි වී තිබුණි. | කොවිඩ් වසංගතය හේතුවෙන් පළාත් කාර්යාල සමග සම්බන්ධිකරණ කටයුතු අඩු මට්ටමක පැවතුනි. එබැවින් 2021 වර්ෂයේ විවිධ ස්ථාන වල සේවා කටයුතු සිදු කිරීම යම් තාක් දුරට ප්‍රමාද විය. ඇතැම් ප්‍රදේශවල පවතින භූජල විද්‍යාත්මක ගති ලක්ෂණ එම සාමීක්ෂණ වල නිරවද්‍යතාවය නිර්ණය කිරීම අපහසු කරයි. එවන් ප්‍රදේශයන් වල භූගත ජලය ප්‍රමාණාත්මකව පවතින බව අදාල පරීක්ෂණයන් මගින් පෙන්නුම් කලද නල ලිං ඉදිකළ විට එම ස්ථානවල භූගත ජලය අවශ්‍ය ප්‍රමාණයට නොපවතින අවස්ථාද පවතී. | ලබාගත් සේවා අත්තිකාරමට අදාල කාර්යය ඉටු කිරිමට අවශ්‍ය කටයුතු සිදු කළ යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| අංක 2010/23 සහ 2017 මාර්තු 16 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය | | | |
| (අ) නියෝග අංක 01 | කෘෂිකාර්මික කටයුතු සඳහා ඉදි කරනු ලබන විෂ්කම්භය මීටර් 4 ක් හෝ ඊට වැඩි වගා ළිං, සඳහා ජල සම්පත් මණ්ඩලයේ ලිඛිත අනුමැතිය ගත යුතු වුවත් මෙතෙක් එකී කිසිදු වගා ලිඳක් සඳහා අනුමැතිය ලබා ගෙන නොතිබුණි. | රෙගුලාසි වලට අනුකූලව කටයුතු නොකරන අවස්ථා වලදි නිතිමය ක්‍රියාමාර්ග ගැනීමට ජල සම්පත් මණ්ඩල පනතෙහි ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවන බැවින් ජල සම්පත් මණ්ඩල පනත සංශෝධනය කර අමාත්‍යාංශය වෙත | නීතිරීති රෙගුලාසි වලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ආ) නියෝග අංක 02 | (i) නළ ළිං ඉදිකිරීමේ නියැලෙන සියලු ආයතන ජල සම්පත් මණ්ඩලයේ ලියාපදිංචි වියයුතු වුවත් සමාලෝචිත වර්ෂය අවසාන වන විට ආයතන 67 පමණක් ලියාපදිංචි වී තිබුණි. එසේම ලියාපදිංචි නොවී සිටින ආයතන මොනවාද යන්න හඳුනා ගැනීම සඳහා ප්‍රමාණවත් වැඩ පිළිවෙලක් ආයතනය විසින් ගෙන නොතිබුණි. | ඉදිරිපත් කර ඇති අතර, ඒ අනුව පණත සංශෝධනය කිරීම සඳහා වන කැබිනට් අනුමැතිය ලැබී ඇත. භූ ගත ජල නියාමන කටයුතු විධිමත්ව පවත්වාගෙන යාම සඳහා ජල සම්පත් මණ්ඩලයේ කාර්ය මණ්ඩලය ප්‍රමාණවත් නොවන බැවින් හා ලංකාවම ආවරණය වන පරිදි අදාල නියාමන කටයුතු සිදු කිරීම සඳහා නව තනතුරු ඇති කර | පනතේ විධිවිධාන කඩකර ඇති ආයතන සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| | (ii) ඉහත ලියාපදිංචි ආයතනය විසින් නව ඉදිකිරීම් කරනු ලබන සියළු ගැඹුරු හෝ නොගැඹුරු නළ ලිංහි දත්තයන් ඇතුලත් වාර්තාවක් සෑම මාස 03 කට වරක් ජල සම්පත් මණ්ජලය වෙත ලබා දිය යුතු වුවත් මෙතෙක් ලියාපදිංචි වූ ආයතන 67 අතරින් කිසිදු ආයතනයක් ඉහත වාර්තාව ඉදිරිපත් කොට නොතිබුණි. | බඳවා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී. වාණිජ අරමුණු වෙනුවෙන් ජලය උකහා ගනු ලබන ආයතනයන්හි තොරතුරු එක් රැස් කර අදාල කටයුතු කිරීම සඳහා සැලසුම් සකස් කරමින් පවතී. අනුමත කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු වී ඇති අත්‍යාවශ්‍ය තනතුරු යම් ප්‍රමාණයකට බඳවා ගනු ලැබූ අතර පුරප්පාඩු පිරවීම | නළ ළිං ඉදිකිරීමේ නියැලෙන ආයතනයන් හි ලියාපදිංචිය අලුත් කිරීම සහ අවලංගු කිරීමට අදාල පාලන පද්ධතීන් හඳුන්වා දිය යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ඇ) | නියෝග අංක 03 | (i) | ජලය බෝතල්කිරීමේ කර්මාන්තයෙහි හා බීම නිෂ්පාදනයෙහි නියැලෙන මොනයම් හෝ රාජ්‍ය හෝ පළාත් පාලන ආයතනයක් හෝ රාජ්‍ය නොවන සංවිධානයක් හෝ අයතනයක් හෝ පුද්ගලයෙකු ස්වභාවික ජල උල්පතක් හෝ භූගත ජලය සිය නිෂ්පාදන කටයුතු සඳහා උපයෝගී කරගනු ලබන්නේ නම් එකී ජල මූලාශ්‍රයේ ජල නියැදියක් සෑම මාස 6 කට වරක් රජයේ පිළිගත් රසායනාගාරයකින් පරීක්ෂාවක් සිදුකර අදාළ විශ්ලේෂණ වාර්තාව අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය අවසාන වන විට ආයතන 40 ක් මණ්ඩලයේ ලියාපදිංචි වී තිබුණ ද කිසිදු ආයතනයක් ඉහත වාර්තා මණ්ඩලය වෙත ලබා දී නොතිබුණි. | සම්පූර්ණ ලෙස සිදු කර ගැනීමට නොහැකි විය. දැනට සිටින කාර්ය මණ්ඩලයේ සහභාගිත්වය සහිතව භූ ගත ජල සම්පත් කළමණාකරනයට අදාලව රාජ්‍ය වගකීමට අදාල කටයුතු සිදු කරමින් පවතී. දැනට පවතින රාජ්‍ය යාන්ත්‍රණය සැලකිල්ලට ගෙන දිස්ත්‍රික් ලේකම්, ප්‍රාදේශිය ලේකම්, ජල සම්පාදන මණ්ඩලය, ප්‍රජා ජල දෙපාර්තමේන්තුව යන ආයතන සම්බන්ධිකරණයෙන් භූගත ජල මූලාශ්‍ර වල තොරතුරු රැස් කර ගැනීමට කටයුතු සම්පාදනය කර ඇති අතර, දැනට එම දත්ත ජල සම්පත් මණ්ඩලය වෙත ලැබෙමින් පවති. මෙම තොරතුරු තවදුරටත් විධිමත්ව ලබා ගැනීම සඳහා අමාත්‍යාංශ ලේකම්තුමා විසින්ද දිස්ත්‍රික් ලේකම්තුමන්ලා වෙත අදාල කාර්යයෙහි වැදගත්කම සඳහන් කරමින් නැවත දැනුවත් කිරීමක් සිදු කරන ලද අතර එම තොරතුරු ක්‍රමවත්ව ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. මෙම දත්ත විශ්ලේෂණය කර වගා ලිං, වාණිජමය, කෘෂිකාර්මික, කර්මාන්ත අවශ්‍යතා සඳහා භාවිතා කරන නල ලිං හඳුනා ගැනීමට කටයුතු කරන අතර, ඒ අනුව නියාමන කටයුතු තවදුරටත් විධිමත්ව පවත්වාගෙන යාමට කටයුතු සිදු කරමින් පවති. | නීතිරීති රෙගුලාසිවලට අනුව කටයුතු කළ යුතුය. |
| | | (ii) | වානිජමය කෘෂිකර්මාන්තය සඳහා හෝ කර්මාන්ත සඳහා මසකට ලීටර් 30,000 ක භූ ගත ජලය ලබා ගන්නා වූ ව්‍යාපෘති සඳහා අදාළ ජල ප්‍රභවය සම්බන්ධව තත්ව වාර්තාවක් (Perimeter Protection Report) ජල සම්පත් මණ්ඩලයෙන් ලබා ගත යුතු වේ. එහි විධිවිධාන ප්‍රකාරව කිසිදු ආයතනයක් අදාළ තත්ව වාර්තාව ලබා ගෙන නොතිබුණි. | | පනතේ විධිවිධාන කඩකර ඇති ආයතන සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඈ) | නියෝග අංක 05 | ස්වභාවික ජල උල්පතක් හෝ භූ ගත ජලය උපයෝගී කර ගනිමින් නිෂ්පාදන හා සේවා කටයුතු සිදු කරනු ලබන ආයතන හෝ ස්ථාන පූර්ව දැනුම් දීමක් සහිතව හෝ රහිතව දවසේ කුමන හෝ සාධාරණ කාලයන්හි දී එකී නිෂ්පාදන හෝ සේවා ස්ථානයන් වලට ඇතුලු වී පරීක්ෂා කළ යුතු වුවද සමාලෝචිත වර්ෂයතෙක් ලියාපදිංචි වී තිබූ පානීය ජල බෝතල් කිරීමේ කර්මාන්ත ශාලා 40 ක කිසිදු ස්ථානීය පරීක්ෂාවක් සිදු කොට නොතිබුණි. | එම | පරීක්ෂා කිරීමේ කාර්යය නිසි පරිදි සිදුකල යුතු අතර එසේ සිදු නොකිරීම සම්බන්ධයෙන් වගකිවයුතු අයට එරෙහිව අවශ්‍ය ක්‍රියාමාර්ග ගතයුතුය. |
| (ඉ) | නියෝග අංක 06 | ඉහත විධිවිධාන ප්‍රකාරව කටයුතු නොකරන රාජ්‍ය හෝ පළාත් පාලන ආයතනයන් හෝ රාජ්‍ය නොවන සංවිධානයන් හෝ පුද්ගලයෙකුට එරෙහිව 1964 අංක 29 දරන සහ සංශෝධිත 1999 අංක 42 දරන ජල සම්පත් මණ්ඩල පනතේ 20 වන වගන්තිය ප්‍රකාරව අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | එම | නීතිරීති රෙගුලාසිවලට අනුව කටයුතු කළ අතර පනතේ විධිවිධාන කඩකර ඇති ආයතන සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.23,910,000 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.12,059,000 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.11,851,000 ක පිරිහීමක් නිරීක්ෂණය විය. ඉකුත් වර්ෂයේ අදායමට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ආදායම රු. 26,855,000 කින් අඩුවීම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අනාර්ථික ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| කොළඹ 07 හෙක්ටර් කොබ්බෑකඩුව මාවතේ පිහිටි නාගරික සංවර්ධන අධිකාරියට අයත් ප්‍රධාන කාර්යාලය පවත්වාගෙන ගිය භූමියෙහි රසායනාගාර ගොඩනැගිල්ලක් ඉදි කිරීම සඳහා වූ සැලසුම් පිළියෙල කිරීමේ කාර්යය වෙනුවෙන් 2015 පෙබරවාරි 25 දින මධ්‍යම ඉංජිනේරු කාර්යයන් පිළිබඳ උපදේශන කාර්යංශය (CECB) වෙත රු.300,000 ක මුදලක් ගෙවා තිබුණි. එසේ ගෙවන ලද මුදල ඉකුත් වර්ෂය අවසානය දක්වා කෙරීගෙන යන වැඩ - ගොඩනැගිලි (Building Working Project) ගිණුමේ දක්වා තිබුණද සමාලෝචිත වර්ෂය දක්වා අදාළ භූමිය නීත්‍යානුකූලව අත්පත් කර ගැනීමට අපොහොසත් වීම මත එම ගොඩනැගිල්ල ඉදිකිරීමේ කාර්යය වෙනුවෙන් දරන ලද වියදම අනාර්ථික ගණුදෙනුවක් ලෙස විගණනයට නිරීක්ෂණය විය. කෙරීගෙන යන වැඩ යටතේ දක්වා තිබූ රු.300,000 ක වටිනාකම සමාලෝචිත වර්ෂයේ ඉදිරියට ගෙන එන ලද ලාභයට වියදමක් සේ ගලපා තිබුණි. | එවකට පිහිටි ප්‍රධාන කාර්යාලයේ රසායනික ගොඩනැගිල්ලක් ඉදි කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීම පිණිස සකසන ගොඩනැගිලි සැලැස්ම යොමු කිරීමෙන් පසු ඒ සඳහා අනුමැතිය නොලැබීම හේතුවෙන් එම මුදල අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනීමෙන් පසුව පොත් වලින් කපා හැරීමට සිදුවිය | වගකිව යුතු නිලධාරින්ට එරෙහිව ආයතන සංග්‍රහයේ II වන කාණ්ඩයේ විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතුය. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) සමාලෝචිත වර්ෂය තුළ ජල සම්පත් මණ්ඩලයෙහි අනුරාධපුර රසායනාගාරය වෙත පරීක්ෂණ කටයුතු සඳහා යොමු කරන ලද ජල සාම්පල් 360 කින් නිමකර තිබුනේ 28 ක් පමණි. තවදුරටත් පරීක්ෂණ 332 ක් සිදුකළ යුතුව තිබූ බැවින් කාර්යසාධනය ඉතා පහල මට්ටමක පවතින බව නිරීක්ෂණය විය. | මෙම ජල සාම්පල් ප්‍රමාණය විශ්ලේෂණය කර අවසන් කිරීම සඳහා 2021 දෙසැම්බර් මස සිට 2022 පෙබරවාරි මස දක්වා සැලසුමක් සකස් කර අදාල රසඥ වෙත උපදෙස් ලබා දුන් අතර , ඒ අනුව එම කටයුතු නියමිත කාලයේදී අවසන් කිරීමට හැකි විය. | අදාල කාලය තුළ පරීක්ෂණ කටයුතු අවසන් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය |

| | | | |
|---|---|---|---|
| (ආ) | කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ඉන්දියානු අධාර නිවාස ව්‍යාපෘතිය මගින් නුවරඑළිය හා මහනුවර දිස්ත්‍රික්කයන්හි වතු නිවාස ආශ්‍රිතව නළ ලිං 6 ක් ඉදි කිරීම සඳහා රු.6,095,000 ක මුදලක් 2020 වර්ෂයේදී මණ්ඩලය වෙත ගෙවා තිබුණි. ඉදිකරන ලද නල ලිං 03 ක් අසාර්ථක වීම හේතුවෙන් ඊට අදාල මුදල වූ රු. 2,883,000 ක් නැවත ගෙවීමට සිදු වී තිබුණි. ඒ අනුව මණ්ඩලයට පාඩුවක් සිදු වී තිබුණු අතර නල ලිං ඉදිකිරීමට අදාල නිර්දේශ ඉදිරිපත් කළ මණ්ඩලයේ භූ ජල විද්‍යාඥයන් එසේ කිරීම සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | මෙම ව්‍යාපෘති යටතේ නල ළිං 06 ක් ඉදිකර ඇති අතර ඉන් නල ළිං 02ක් පමණක් ප්‍රමාණවත් තරම් ජලය නොමැති වීම නිසා අසාර්ථක වී ඇත. එක් ස්ථානයක නල ළිඳ ඉදිකිරීමට අවශ්‍ය මාර්ගය සකසා නොමැති බැවින් ළිඳ ඉදිකර නොමැත. ඉදිරියේදී මෙවැනි තත්වයන් මඟ හරවා ගැනීමට කටයුතු කරන ලෙස අදාල භූ විද්‍යාඥයින්ට උපදෙස් ලබාදෙන ලදි | වගකිව යුතු නිලධාරින්ට එරෙහිව ආයතන සංග්‍රහයේ II වන කාණ්ඩයේ විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතු අතර නළ ළිං ඉදිකිරීමට අදාල ක්‍රියාවලිය සමාලෝචනයට ලක්කොට අවශ්‍ය වැඩිදියුණු කිරීම සිදු කළ යුතුය. |
| (ඇ) | නොරොච්චෝල ප්‍රදේශයේ පිහිටා ඇති ලක් විජය බලාගාරය අවට ප්‍රදේශයේ ස්ථාපිත කොට ඇති නළ ලිං හි ජල සාම්පල් 50 ක් පරීක්ෂා කිරීමට අදාළ කාර්යයන් ඉටු කිරීම සඳහා ජල සම්පත් මණ්ඩලය විසින් භාර ගෙන තිබුණද අනුරාධපුර රසායනාගාරයෙහි කටයුතු 2018 වර්ෂයේ ආරම්භ කළ අවධියේ පටන් පැවති විදුලි පද්ධතියේ බිඳ වැටීම් හේතුවෙන් සහ මණ්ඩලයේ ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේ පිහිටි රසායනාගාරයෙහි ස්ථාපිත කොට ඇති බැර ලෝහ විශ්ලේෂණ යන්ත්‍රය (shimaza AA- 6300) 2018 වර්ෂයේ සිට අක්‍රියව පැවතිම හේතුවෙන් එම කාර්යය බාහිර ආයතනයකින් කරවා ගැනීමට රු.3,831,300 ක වටිනාකමක් ගෙවා තිබුණි. ඒ අනුව මණ්ඩලය විසින් තමන් සතු සම්පත් නිසි පරිදි අලුත්වැඩියා කර උපයෝජනය නොකිරීම හේතුවෙන් රු.3,831,300 ක ආදායමක් සමාලෝචිත වර්ෂයේදී මණ්ඩලයට අහිමි වී තිබුණි. | AAS උපකරණය කලක් භාවිතා කළ උපකරණයක් වන අතර ICP-MS උපකරණය නවීන අධි තාක්ෂණ, පරාමිති කිහිපයක් එකවර කඩිනමින් විශ්ලේෂණය කර ගත හැකි සංවේදී උපකරණයකි. අදාල ව්‍යාපෘතියේ අවශ්‍යතාවය වූයේ විශ්ලේෂණ කටයුතු වැඩි නිරවද්‍යතාවය නවීන උපකරණයක් මගින් සිදු කිරීම වූ බැවින් 2021.03.30 දින පැවති අංශ ප්‍රධාන රැස්වීමේදී මෙම විශ්ලේෂණ කටයුතු ITI ආයතනයට ලබා දීමට තීරණය කරන ලදී. | වගකිව යුතු නිලධාරින්ට එරෙහිව ආයතන සංග්‍රහයේ II වන කාණ්ඩයේ විධිවිධානවලට අනුකූලව කටයුතු කළ අතර මණ්ඩලය සතු සම්පත් නිවැරදි පරිදි යොදා ගෙන ආදායම් උත්පාදනය කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | ජල සම්පත් මණ්ඩල පනත සංශෝධනය කිරීමට සඳහා 2021 ජූලි 12 දින අමාත්‍ය මණ්ඩලය නියෝග කර තිබුණි. එසේ වුවද සමාලෝචිත වර්ෂය අවසාන තෙක් අදාල කෙටුම්පත නීතිපතිවරයාට ඉදිරිපත් කර නොතිබුණි. පනත සංශෝධනය කර ගැනිමට කටයුතු නොකිරිම නිසා පනත සංශෝධනය කිරීමේ අරමුණ ලෙස හදුනාගෙන ඇති වැරදි සහ ඊට අදාල දඩුවම් පැමිණවීමේදී පැන නගින ගැටලු සහ භූගත ජලය අවභාවිතා කිරිම හා අසීමාන්තික ලෙස උකහා ගැනීමේ ගැටලු සම්බන්ධ ක්‍රියාමාර්ග ගැනීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණි. | පනත සංශෝධනය කර අමාත්‍යාංශයට යොමු කර ඇති අතර, ආණ්ඩු පක්ෂ පාර්ලිමේන්තු ගරු ඇමතිතුමන්ලා හා මන්ත්‍රීතුමන්ලා වෙත 2022.02.08 දින ඉදිරිපත් කිරීමට සැළසුම් කල අතර කෙසේ වුවද, එම දින වල රටේ පැවැති කොවිඩ් 19 තත්වය මත එදින එය ඉදිරිපත් කිරීමට නොහැකි විය. | අමාත්‍ය මණ්ඩල තීරණයට අනුගතව ජල සම්පත් මණ්ඩල පනත සංශෝධනය කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඉ) | නාගරික සංවර්ධන අධිකාරියට අයත්, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ පිහිටි පර්චස් 40 කින් යුත් ඉඩම 2016 දෙසැම්බර් 06 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි වර්ෂ 30 ක කාල සීමාවක් සඳහා ජල සම්පත් මණ්ඩලය වෙත ලබාදීමට තීරණය කර තිබුණි. එකී ඉඩම සඳහා රජයේ ප්‍රධාන තක්සේරු කරු විසින් වාර්ෂිකව රු.2,700,000 ක බදු මුදලක් තීරණය කර තිබුණි. එකී ඉඩම සඳහා නාගරික සංවර්ධන අධිකාරිය සමග විධිමත් ගිවිසුමකට එලඹීමකින් තොරව 2016 වර්ෂයේ සිට වාර්ෂික බදු කුලී ගෙවීමට කටයුතු කර තිබුණි. මෙම ඉඩම සැලසුම්කල පරිදි භාවිතයට ගෙන නොතිබුණු අතර මේ දක්වා එකී ඉඩම සඳහා ගෙවූ රුපියල් 10,745,680 නිෂ්කාර්ය වියදමක් බවට පත්ව තිබුණි. | නාගරික සංවර්ධන අධිකාරියට අයත් ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ පිහිටි පර්චස් 40 ක ඉඩම මණ්ඩලය වෙත 2016.10.10 දින භෞතිකව භාරදෙන ලද අතර 2017 වර්ෂයේදී ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා සැලැස්මක් අනුමැතියට ඉදිරිපත් කර තිබුණු අතර 2018 වසරේදී අධ්‍යක්ෂ මණ්ඩලය වෙනස්වීම හේතුවෙන් ඉදිකිරීම් කටයුතු කරගෙනයාම නවතන ලදී. නැවත 2020 වර්ෂයේදී සැලසුම් සකස් කර ගොඩනැගිල්ලක් ඉදිකිරීමට අවශ්‍යය අනුමැතීන් ලබා ගැනීමට ඉදිරිපත් කර ඇත. ගිවිසුම අත්සන් කිරිම සඳහා නීති ගාස්තු හා මුද්දර ගාස්තු ගෙවීමට කටයුතු කර ඇති අතර කෙටුම්පත් ගිවිසුම් පත්‍රයක් ලබාදී ඇත. | නාගරික සංවර්ධන අධිකාරිය සමග විධිමත් පරිදි ගිවිසුමකට එළඹිය යුතු අතර සැලසුම් කල පරිදි ඉඩම උපයෝජනයට ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඊ) | අග්‍රාමාත්‍ය ලේකම් විසින් 2021 අප්‍රේල් 29 දින ඉදිරිපත් කර තිබු අංක PMO/2/13/20/bldg දරණ ලිපිය මගින් කර තිබූ ඉල්ලීමක් මත ජල සම්පත් මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය එම ස්ථානයෙන් ඉවත් කර ගැනීමට කටයුතු කර තිබුණි. එම ඉඩම හා ගොඩනැගිල්ල අග්‍රාමාත්‍ය කාර්යාලය වෙත භාර දීමේ ලේඛන කිසිවක් විගණනයට | කොළඹ 07 හෙක්ටර් කොබ්බෑකඩුව මාවතේ ජල සම්පත් මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය පිහිටි ඉඩම ජල සම්පත් ණ්ඩලයට අයත් ඉඩමක් නොවන බව කාරුණිකව දන්වමි. අග්‍රාමාත්‍ය ලේකම් කාර්යාලය විසින් ඉදිරිපත් කරන ලද 2021.04.29 දිනැති ලිපිය මගින් දැනුම් දී ඇත්තේ බිම කොටස | ප්‍රධාන කාර්යාලය කුලී පදනම මත වෙනත් ස්ථානයකට ගෙනයාමේ දී දැරීමට වන පිරිවැය හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්මට ඇතිවන බලපෑම සම්බන්ධව අමාත්‍ය මණ්ඩලය දැනුවත් කොට අවශ්‍ය ක්‍රියාමාර්ග |

| | | | |
|---|---|---|---|
| | ඉදිරිපත් නොවුනි.එම භූමියේ පිහිටි ගොඩනැගිලි වෙනුවට වෙනත් ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන මුදල් අමාත්‍යාංශය මගින් ලබාදෙන බව එකී ලිපියේ සඳහන් වුවද ඒ අනුව අදාල ප්‍රතිපාදන ලබාගැනීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්තිමය නිශ්කාෂණ ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. 2022 වර්ෂයේ විසර්ජන පනත මගින් ද ඒ සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණි.හෙක්ටර් කොබ්බෑකඩුව මාවතේ පිහිටි ප්‍රධාන කාර්යාලය 2021 ජූලි මස 19 දින සිට රාජගිරියේ පිහිටි පෞද්ගලික ගොඩනැගිල්ලක් මාසිකව රුපියල් 950,000 කුලී මුදලක් යටතේ ලබාගෙන ඊට ගෙනගොස් තිබුණි. එකී ගොඩනැගිල්ලේ ප්‍රධාන කාර්යාලය ස්ථාපනය කිරීම සඳහා රුපියල් 671,985 ක පිරිවැයක් දරා තිබුණි. සමාලොචිත වර්ෂය අවසන්වන විට එකී ගොඩනැගිලල් සඳහා රුපියල් 4,750,000 කුලී මුදලක් ගෙවා තිබුණි. අදාල ගිවිසුම වර්ෂයක කාලයක් සඳහා පමණක් වලංගු වන ලෙස එළඹ තිබීම හේතුවෙන් 2022 ජූලි මස 18 දිනට පසු ජල සම්පත් මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය වෙනත් ස්ථානයකට ගෙනයාමට සිදුවී තිබුණි. | 2021.05.01 දිනට පෙර ලබාදීමට වන අතර තාවකාලික ගොඩනැගිල්ලක් ලබාගෙන ජල සම්පත් මණ්ඩලයේ කාර්යාලයන් ප්‍රතිස්ථාපනය කරන ලෙසත්ය. ඒ අනුව තාවකාලික ගොඩනැගිල්ලක් ලබාගෙන 2021.07.19 දින සිට ජල සම්පත් මණ්ඩලය පවත්වාගෙන යනු ලබන අතර ඒ සඳහා වන මාසික කුලිය අග්‍රාමාත්‍ය කාර්යාලය විසින් ගෙවීමට කටයුතු කර ඇත. වෙනත් ගොඩනැගිල්ලක් ඉදිකිරීමට කටයුතු ආරම්භ කර නොමැති අතර එවැනි අවස්ථාවකදී අවශ්‍ය ප්‍රතිපාදන අවස්ථානුකූලව ලබාගැනීමට අවශ්‍ය කටයුතු ඉදිරියේදී සිදු කරනු ලබන බව දන්වමි. | ගත යුතුය. |
| (ට) | ශ්‍රී ලංකාවේ භූගත ජලයේ පවතින ප්‍රමාණාත්මක හා ගුණාත්මක තත්ත්වයන් කලමණාකරණය කිරිම සඳහා අවශ්‍ය දත්ත පද්ධතියක් ස්ථාපනය කිරීමට ජල සම්පත් මණ්ඩලය විසින් 2015 වර්ෂයේ සකස් කරන ලද ව්‍යාපෘති යොජනාවක් පදනම් කොට ගෙන, ශ්‍රී ලංකාව සඳහා භූගත ජල විමංසන තොරතුරු ජාලයක් ස්ථාපිත කිරිම සඳහා 2015 ජූලි මස 10 දින අමාත්‍ය මණ්ඩල සංදේශය ඉදිරිපත් කර තිබුණු අතර ප්‍රථමයෙන් වකුගඩු රෝගය විශාල වශයෙන් ව්‍යාප්ත වී ඇති අනුරාධපුරය සහ පොළොන්නරුව වැනි තෝරා ගත් දිස්ත්‍රික්ක කිහිපයක නියමු | එම පුහුණුව ලබාදීම සඳහා නෙදර්ලන්ත විදුම් කාර්ය මණ්ඩල වසර 1 ½ කට අධික කාලයක් දිවයිනට නොපැමිණීම හේතුවෙන් පුහුණු කටයුතුවල ප්‍රමාදයක් සිදු විය. 2022.01.01 දින සිට ජල සම්පත් මණ්ඩලයේ විදුම් නිලධාරීන් දෙදෙනෙකු පුහුණු කළ අතර, විදුම් කටයුතු වල යොදවා ඇත.<br>එම ඉඩම විධිමත් පරිදි ජල සම්පත් මණ්ඩලයට පවරා දී නොතිබුණු හෙයින් ගොඩනැගිලි සැලැස්ම සකස් කිරීමට කොන්ත්‍රාත්කරුට හැකියාවක් නොතිබුණි. දත්ත මධ්‍යස්ථාන ගොඩනැගිල්ලට අමතරව ජල | ව්‍යාපෘති සැලැස්මට අනුකූලව කටයුතු නොකිරීම මගින් ඇතිවන බලපෑම සම්බන්ධයෙන් විධිමත් විමර්ශණයක් මගින් තක්සේරු කර වගකිව යුතු නිලධාරින්ට එරෙහිව ආයතන සංග්‍රහයේ II වන කාණ්ඩයේ විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතුය. |

ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී තිබුණි. එකී ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා නෙදර්ලන්තයේ රෝයල් අයිකල් කැම්ප් (Eijkelkamp Earth Sampling Group) ආයතනය වෙත යූරෝ 20,629,921 පිරිවැයක් මත පිරිනැමීම සඳහා 2017 ඔක්තෝම්බර් 03 දින ගිවිසුමකට එළඹ තිබුණි. ව්‍යාපෘතිය යටතේ යූරෝ 2,240,030 ක් හෙවත් රුපියල් මිලියන 393.976 ක්වූ විදුම් යන්ත්‍ර 02 ක් ව්‍යාපෘතිය අවසන්යේ පසු මණ්ඩලයට පවරාදීමට නියමිතව තිබුණද එම යන්ත්‍ර ක්‍රියාකරවීමට අවශ්‍ය පුහුණුව ලබාදී නොතිබුණි. ව්‍යාපෘතිය යටතේ යූරෝ 1,033,928 ක් වැයකර ඉදිකිරීමට යෝජිත දත්ත මධ්‍යස්ථානය වර්ෂ 04 ක් ගතවී තිබුණද ඉදිකර නොතිබුණි. ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලට සමගාමීව ගොඩනැගිල්ල ඉදිනොකිරීම හේතුවෙන් ව්‍යාපෘතියේ අරමුණු හා අපේක්ෂිත ප්‍රතිලාභ ලබාගත නොහැකිවී තිබුණි.

සම්පත් මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය පිහිටුවීම සඳහා ද යූරෝ 439,539.00 ක් වෙන් කරන ලදී. මේ වන විට රටෙහි ඇතිව තිබෙන ආර්ථික අර්බුදය හේතුවෙන් මෙම ගොඩනැගිල්ල ඉදිකිරීම ව්‍යාපෘතියේ අනුමත ප්‍රතිපාදිත මුදලින් සිදුකිරීම අසීරු වී ඇත. කෙසේ නමුත් මේ වන විටත් දත්ත මධ්‍යස්ථානයක් රත්මලාන ව්‍යාපෘති කාර්යාලයෙහි ස්ථාපිත කර ඇති බැවින් ව්‍යාපෘතියෙහි අරමුණුවලට කිසිදු අහිතකර බලපෑමක් සිදු වී නොමැත.

## 3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) අනුරාධපුර පලාත් කාර්යාලයේ ස්ථාපිත කරන ලද රසායනාගාරය වෙත සපයා තිබූ භූගත ජලයේ පවතින කෘෂි රසායනයන් පිළිබඳ විශ්ලේෂණය කිරීම සඳහා යොදා ගන්නා රු.32,535,430 ක් වටිනා GC MS -MS යන උපකරණය සැපයූ දින සිට අක්‍රීය තත්ත්වයේ පැවතියද එකී උපකරණය සැපයුම්කාර සමාගම විසින් ලබා දී තිබූ | මෙම උපකරණය සැපයූ දින සිට අක්‍රිය තත්වයේ නොපැවතින. අදාල සැපයුම්කාර සාමාගම විසින් ජල සම්පත් මණ්ඩලයේ රසායානාගාර කාර්ය මණ්ඩලය පුහුණු කරන අතරතුර කාලයේදී උපකරණ අක්‍රිය වූ අතර එය පිළිසකර කිරීම සඳහා රුපියල් 3,820,129 වටිනාකමකින් යුතු කොටසක් සවි කිරිමට අවශ්‍ය විය. ඒ වන විට වර්ෂයක වගකීම් කාලය | උපකරණ අක්‍රීය තත්ත්වයට පත්වන තෙක් අවශ්‍ය ක්‍රියාමාර්ග නොගැනීම සම්බන්ධයෙන්, වගකිව යුතු නිලධාරින්ට එරෙහිව ආයතන සංග්‍රහයේ II වන කාණ්ඩයේ විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | වර්ෂයක වගකීම් කාලය (2018.08.09 සිට 2019.08.08) තුළ එය අලුත්වැඩියා කර ගැනිමට කටයුතු කර නොතිබුණි. ජලයේ පවතින කෘෂි රසායන සංයුතිය විශ්ලේෂණය කළ හැකි වෙනත් කිසිදු උපකරණයක් ජල සම්පත් මණ්ඩලය සතුව නොතිබියදි එම උපකරණය අලුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනිමට කටයුතු කරනු වෙනුවට එය භාවිතයට ගැනිමට නොහැකි ලෙස සලකා වෙනත් ව්‍යාපෘතියකට ලබාදිමට සභාපතිවරයා කටයුතු කර තිබිම විගණනයේදී ගැටළුසහගත තත්ත්වයක් විය. | අවසන් වී තිබු බැවින් එම මුදල මණ්ඩලයට දැරීමට සිදු විය. මේ වන විට මණ්ඩලයේ තිබු මූල්‍යමය අපහසුකම් හේතුවෙන් මෙම උපකරණය JRDC ව්‍යාපෘතියට ලබා දීමට මණ්ඩල කළමණාකාරිත්වය තීරණය කරන ලදී. මෙවැනි උපකරණයක් නඩත්තු කිරීමට හා විශ්ලේෂණ කටයුතු පවත්වාගෙන යාමට මූල්‍යමය හැකියාවක් මෙම අවස්ථාවේදී මණ්ඩලය සතුව නොපැවතීම නිසාත් රුපියල් 3,820,129 වටිනාකමකින් යුතු කොටසක් නැවත සවි කිරීමට සිදු වීම නිසාත් චීන ලංකා පර්යේෂණ ව්‍යාපෘතියට සභාපතිතුමා විසින් භාර දීමට තීරණය කරන ලදී. | |
| (ආ) | ජල සම්පත් මණ්ඩලය සතුව විදුම් යන්ත්‍ර 16 ක් පැවති අතර ඉන් 03 අක්‍රීය තත්වයේ පැවතීම හේතුවෙන් 2013 වර්ෂයේ සිට අපහරණය කිරීමට සැලසුම් කොට තිබුණද මෙතෙක් අපහරණය කොට නොතිබුණි. විදුම් යන්ත්‍ර 05 ක් අලුත්වැඩියා කලයුතු තත්වයේ පැවතියද මෙතෙක් අදාල කටයුතු අවසන් කොට නොතිබුණි. සමාලෝචිත වර්ෂය තුල විදුම් යන්ත්‍ර 08ක් පමණක් සේවයේ යොදවා තිබුණි. 2021 වර්ෂයේ නළ ළිං 80 ක් පමණක් ඉදි කර තිබූ අතර ඒ අනුව විදුම් අංශයේ කාර්ය සාධනය ඉතා පහළ මට්ටමක පවතින බව නිරීක්ෂණය විය. | රටේ පැවති කෝවිඩ් තත්වය යටතේ නල ළිං විදුම් සඳහා ඉල්ලීම් විශාල ලෙස ලැබී නොතිබුණි. එසේම පැවති කෝවිඩ් තත්වය හමුවේ ජ.ස.ම. මුදල් ගෙවා තිබූ නල ළිං 80 ක් 2021 වසරේ ඉදි කරන ලදී. 2021 වර්ෂයේ අවසන් වන විට නල ළිං විදීමට ලැබී තිබූ ඉතිරි ප්‍රමාණය ජනවාරි මස සහ පෙබරවාරි මස ඉදි කරන ලදී. එම ප්‍රමාණය නල ළිං 20 කි. විදුම් යන්ත්‍ර අළුත් වැඩියාව සඳහා කටයුතු කරමින් පවතින අමතර කොටස් හිගතාවය නිසා සහ කෝවිඩ් තත්වය හමුවේ එය ප්‍රමාද බවක් පවතී.අපහරණය කළ යුතු විදුම් යන්ත්‍ර පිළිබඳව තීරණයක් ගෙන නැවත අපහරණය සඳහා ටෙන්ඩර් කළ යුතු වේ. | විදුම් අංශයේ කටයුතු පිළිබඳව සමාලෝචනයක් සිදුකර වත්කම් කාර්්‍යක්ෂමව උපයෝජනය කිරීමට කටයුතු කල යුතුය. |